සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

11 ශ්‍රේණිය — අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2019 — 11 S I

බුද්ධ ධර්මය I, II — කාලය පැය තුනයි

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.**

- අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමත් යොදාගන්න.

සැලකිය යුතුයි :-

**i.සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

**ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්න වලට දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදී හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.**

**iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ( x) ලකුණ යොදන්න.**

**iv. එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.**

## බුද්ධ ධර්මය I

01. " මම සසර දුකට මුල්වන පංචස්කන්ධය නැමැති ගෙය තනන වඩුවා සොයා සසර නොයෙක් ජාතිවල ඇවිද්දෙමි" .... මෙම අර්ථය සඳහන් ගාථාවේ මුල් දෙපදය වනුයේ,
1. "ආරභථ නික්ඛමථ - යුඤ්ජථ බුද්ධ සාසනේ ....." යන්න ය.
2. "අනේක ජාති සංසාරං - සන්ධාවිස්සං අනිබ්බිසං ..." යන්න ය.
3. අක්කොච්ඡි මං අවධි මං - අජිනි මං අහාසිමේ ...." යන්න ය.
4. "යෝ චේ වස්සසතං ජීවේ - දුස්සීලෝ අසමාහිතෝ ..." යන්න ය.

02. යම් ක්‍රියාවකට නුවණැති අය නින්දා කරත් නම් එබඳු කුඩා වූ වරදකින් පවා වැළකීමට උත්සහ කළ යුතු බව දක්වා ඇත්තේ ,
1. මහා මංගල සූත්‍රයේ ය. 2. පරාභව සූත්‍රයේ ය. 3. කරණීය මෙත්ත සූත්‍රයේ ය. 4. ව්‍යග්සපජ්ජ සූත්‍රයේ ය.

03. මහා සංසරත්නය මනා පිළිවෙත් පුරන බැවින්
1. සුපටිපන්න නම් වන සේක. 2. ආහුණෙය්‍යා නම් වන සේක.
3. සාමීචිපටිපන්න නම් වන සේක. 4. පාහුණෙය්‍යය නම් වන සේක.

04. පංචස්කන්ධයට අයත් "විඤ්ඤාණය" යන්නෙහි අදහස වන්නේ,
1. සිතෙහි ඇතිවන වින්දනය යන්නයි. 2. අරමුණු දැන ගැනීම යන්නයි.
3. හඳුනාගෙන රැස් කරන දෙය යන්නයි. 4. සිත තුළ උපදින සටහන්ය යන්නයි.

05. සාමඤ්ඤඵල සූත්‍රයට අනුව පංච නීවරණ ධර්මයන්ගෙන් වනයක අතරමං වුවෙකුට උපමා කර ඇත්තේ,
1. කාමච්ඡන්ද නීවරණය යි. 2. ව්‍යාපාද නීවරණය යි.
3. උද්ධච්ච කුක්කුච්ච නීවරණය යි. 4. විචිකිච්ඡා නීවරණය යි.

06. බුදුරජාණන් වහන්සේ දොළොස්වන වස් කාලය ගත කළේ,
1. විශාලා මහනුවරය. 2. වේරංජාපුර නුවරය.
3. බරණැස ඉසිපතන මිගදායේ ය. 4. චම්පා නුවරය.

07. ජීවක අඹ උයනෙහි බුදුරජාණන් වහන්සේ ඇතුළු භික්ෂූන් වහන්සේ එක් දහස් දෙසීය පිරිසකගෙන් කිවිසුම් හඬක් වත් නොඇසීම නිසා උන්වහන්සේ හමුවීමට පැමිණි රජු බියට පත් විය. එම රජතුමා වූයේ ,
1. අජාසත් රජතුමා ය. 2. බිම්බිසාර රජතුමා ය.
3. කොසොල් රජතුමා ය. 4. උදේනි රජතුමා ය.

08. ඉතා ගිජු ලෙස ආහාර අනුභව කරන්නන් පස් දෙනෙකු ගැන බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් වේ. ඒ අතරින් අනුන්ගේ අත් උදව් නැතිව නැගිටින්නට බැරි තරමට අධිකව ආහාර ගන්නා තැනැත්තා හඳුන්වා ඇත්තේ,
1. තත්ථාවට්ටක ලෙස ය. 2. හුත්තවමිතක ලෙස ය.
3. ආහාර හත්ථක ලෙස ය. 4. කාකමාසක ලෙස ය.

09. වචනයෙන් සිදුවන අකුසල කර්ම හතරකි. එයින් පිසුනාවාචා යනුවෙන් හඳුන්වනුයේ,
1. කේලාම් කීමය. 2. බොරු කීමය.
3. හිස් වචන කීමය. 4. පරුෂ වචන කීමය.

10. අති පූජ්‍ය රේරුකානේ චන්දවිමල මහ නාහිමිපාණන් වහන්සේ විසින් රචිත ග්‍රන්ථයක් නොවන්නේ,
1. ධර්ම විනිශ්චය යි. 2. පාරමිතා ප්‍රකරණය යි.
3. සතර බණවර සන්නය යි. 4. අභිධර්ම මාර්ගය යි.

11. ලොවෙහි ඇති සියල්ල අනිත්‍යය, දුක් සහිතය, අනාත්මය යන සත්‍යය දුන දැක පසක් කිරීම බුදු දහමේ දැක්වෙන්නේ,
1. චිත්ත භාවනාව ලෙස ය. 2. ප්‍රඥා භාවනාව ලෙස ය.
3. සමාධි භාවනාව ලෙස ය. 4. සමථ භාවනාව ලෙස ය.

12. ජාත, රූප, රජත, පටිග්ගහණ නම් වූ රන්, රිදී, මසු, කහවණු ආදී මූල්‍ය සම්පත් භාවිතයෙන් වැළකීම යන ශික්ෂාපදය ඇතුළත් වන්නේ,
1. සතර සංවර සීලයේ ය. 2. උපෝසථ අෂ්ටාංග සීලයේ ය.
3. ආජීව අෂ්ටමක සීලයේ ය. 4. දස සීලයේ ය.

13. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි මෙලොව හිතසුව පිණිස හේතු වන කරුණු හතරක් බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට ඇත. එයින් 'උට්ඨාන සම්පද' යනුවෙන් හඳුන්වා ඇත්තේ තමන් කරන කවරම හෝ රැකියාවක නිරත විය යුතු ආකාරයයි. ධනය ඉපයීමේ දී "සේදා වක්ඛිත්තා" යනුවෙන් දක්වා ඇත්තේ,
1. දැතේ මහන්සිය යි. 2. දහදිය හෙළීම යි.
3. ධාර්මික ක්‍රියා අනුගමනය යි. 4. උත්සහය යි.

14. බුදුරජාණන් වහන්සේ අනුදන වදාළ සිතීමේ හා විමසීමේ නිදහස යන මාතෘකාව උපයෝගී කොට ගෙන දේශනයක් කළ අයෙකු පරම්පරාවෙන් ආ පමණින් ද, පොත පතේ තිබුණ පමණින් ද,තර්කානුකූල වන නිසාද යමක් පිළිගත යුතු නැති බව දේශනා කරන ලදි. ඔහු මේ සඳහා උපයෝගී කොට ගන්නට ඇති සූත්‍ර දේශනාව විය හැක්කේ,
1. අග්ගඤ්ඤ සූත්‍ර දේශනාවයි. 2. වීමංසක සූත්‍ර දේශනාවයි.
3. කාලාම සූත්‍ර දේශනාවයි. 4. සච්චක සූත්‍ර දේශනාවයි.

15. සැප දුක දෙකෙහි දී ම තමා හා අනුන් සමාන ලෙස සළකා ක්‍රියා කිරීමේ ගුණාංගය හඳුන්වන්නේ,
1. සමානාත්මතාවය ලෙසයි. 2. සමජීවිකතාව ලෙසයි.
3. අර්ථචර්යාව ලෙසයි. 4. සන්තුට්ඨිතාව ලෙසයි.

16. මට්ටකුණ්ඩලී නම් තරුණයා මරණාසන්න අවස්ථාවේ දී බුදුරදුන් දැක සිත පහදවා ගත් පිනෙහි ප්‍රතිඵලයක් ලෙස දෙව්ලොව උපන්නේය. ඉන් ප්‍රකට වන කර්මය වන්නේ,
1. කටත්තා කර්මය යි . 2. ආචිණ්ණ කර්මය යි.
3. ආසන්න කර්මය යි. 4. ගරුක කර්මය යි.

17. 'ප්‍රතිසන්ධි සිත හේතු කොටගෙන රූප වේදනා ආදී පංචස්කන්ධයක් ඇති වෙයි' මෙම අදහස ගෙන දෙන වැකිය වන්නේ,
1. "අවිජ්ජා පච්චයා සංඛාරා" යන්නයි . 2." සංඛාරා පච්චයා විඤ්ඤාණං" යන්නයි .
3. "විඤ්ඤාණ පච්චයා නාම රූපං" යන්නයි . 4. "නාම රූප පච්චයා සළායතනං" යන්නයි .

18. බුදුරජාණන් වහන්සේගේ ධර්මයෙහි අන්තර්ගත දේශනාවක් වනුයේ,
1. සියල්ල පූර්ව කර්මය අනුව සිදුවේ යන්නයි.
2. සියල්ල හේතුඵල න්‍යාය ධර්මය අනුව සිදුවේ යන්නයි.
3. සියල්ල ඊශ්වරයාගේ කැමැත්ත අනුව සිදුවේ යන්නයි.
4. සියල්ල අහේතුකව ඉබේ සිදුවේ යන්නයි.

19. ඇතිවීම් නැතිවීම් හේතුවෙන් හටගන්නා දුක හඳුන්වන්නේ,
1. දුක්ඛ දුක්ඛතා යනුවෙනි. 2. ජාති දුක්ඛතා යනුවෙනි.
3. විපරිණාම දුක්ඛතා යනුවෙනි. 4. සංඛාර දුක්ඛතා යනුවෙනි.

20. නිවැරදි වූ කාය වාග් හා මනෝ කර්මයෙන් යුතුව ක්‍රියා කිරීමෙන් ඇතිවන සැපය හඳුන්වන්නේ,
1. අත්ථි සුඛය නමිනි. 3. අනණ සුඛය නමිනි.
2. භෝග සුඛය නමිනි. 4. අනවජ්ජ සුඛය නමිනි.

21. සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන ආකාරයට භෝග විනාශයට හේතු වන කරුණු අතරට අයත් නොවනුයේ,
1. පවිටු මිතුරන් ඇසුරයි. 2. සූදුවෙහි යෙදීමයි.
3. අනලස් බවයි. 4. නැටුම් ගැයුම් වැයුම් හි ලොල් බවයි.

22. මෙරට පාලි ත්‍රිපිටකය ඉංග්‍රීසියට පරිවර්තනය කොට බෙදා හැරීම සඳහා එංගලන්තයේ පාලි ග්‍රන්ථ සමාගම පිහිට වූයේ,
1. සර් එඩ්වින් ආර්නෝල්ඩ් විසින් ය. 2. රීස් ඩේවිඩ්ස් පඬිතුමා විසින් ය.
3. මහාචාර්ය සෝණ්ඩර්ස් විසින් ය. 4. මහාචාර්ය මැක්ස්මුලර් විසින් ය.

23. යම් කාර්යක නිරත වීමේ දී ඇති කරගත යුතු වීර්ය හඳුන්වන්නේ
1. ආරම්භ ධාතු නමිනි. 2. ථාම ධාතු නමිනි. 3. නික්කම ධාතු නමිනි. 4. පරක්කම ධාතු නමිනි.

24. මහා කපි ජාතකය හා මස මානවක ජාතක කථා තුළින් ප්‍රකට වන්නේ,
1. මෛත්‍රී පාරමිතාවයි. 2. උපේක්ෂා පාරමිතාවයි
3. අධිෂ්ඨාන පාරමිතාවයි. 4. වීර්ය පාරමිතාවයි

25. තමන් කරන ක්‍රියාවන්හි විපාක තමන් කරා පැමිණෙන බව දැකීම හඳුන්වන්නේ,
1. කම්මස්සකතා සම්මා දිට්ඨිය නමිනි. 2. විදර්ශනා සම්මා දිට්ඨිය නමිනි.
3. ධ්‍යාන සම්මා දිට්ඨිය නමිනි. 4. මාර්ග සම්මා දිට්ඨිය නමිනි.

26. දුකට පත් වූවන් දුකෙන් මුදවා ගැනීම සඳහා සිතෙහි ඇතිවන අනුකම්පාව හැඳින්වෙන්නේ,
1. මෙත්තා නමිනි. 2. කරුණා නමිනි. 3. මුදිතා නමිනි. 4. උපේක්ඛා නමිනි.

27. රාජ්‍ය පාලනයේ දී පාලකයෙකු පසිඳුරන් පිනවීමට ගිජු නොවී ක්‍රියා කළ යුතුය යන කරුණ අන්තර්ගත වන්නේ,
1. දස සක්විතිවත් වලය. 2. සප්ත අපරිහානිය ධර්ම වලය.
3. දස රාජ ධර්ම වලය. 4. දස පින්කිරියවත් වලය.

28. පංච බලි අතර අතිථි බලි යනුවෙන් දක්වෙන්නේ,
1. ආගන්තුක සත්කාරය යි. 2. මියගිය ඥාතීන්ට යුතුකම් ඉටු කිරීමයි.
3. ඥාතීන්ට සැළකීමයි. 4. දෙවියන්ට පින් දීමයි.

29. තෙවැනි ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස පරවාද පන්සියයක් හා ඒවා ඛණ්ඩනය කිරීම සඳහා වන සකවාද පන්සියයක් ඇතුළත් කර සම්පාදිත ග්‍රන්ථය වන්නේ,
1. ධාතුකථා ප්‍රකරණය යි. 2. යමක ප්‍රකරණය යි.
3. පට්ඨාන ප්‍රකරණය යි. 4. කථාවත්ථු ප්‍රකරණය යි.

30. ධර්මාශෝක රජතුමාගේ ධර්ම විජය ප්‍රතිපත්තිය අනුව ථෙරවාදී බුදු දහම දේශ දේශාන්තරවල ව්‍යාප්ත කිරීමේ දී සෝණ, උත්තර යන තෙරුන් වහන්සේලා දෙනම ස්වර්ණ භූමියට වැඩම කර දේශනා කරන ලද ප්‍රථම සූත්‍රය වන්නේ,
1. දේවදූත සූත්‍රය යි. 2. ආසිවිසෝපම සූත්‍රය යි. 3. බ්‍රහ්මජාල සූත්‍රය යි. 4. කාලකාරාම සූත්‍රය යි.

31. බුදු දහමේ ඉගැන්වෙන සංසාර සාගරයෙන් එතෙර වීමට පුද්ගලයාට සසර ගමනට වියදම් කිරීමට අවශ්‍ය වන්නේ,
1. කුසල නමැති ධනය යි. 2. ශ්‍රද්ධාව නමැති ධනය යි.
3. භක්තිය නමැති ධනය යි. 4. දැහැමින් උපයන ධනය යි.

32. සිංහලයේ විශිෂ්ටතම මහා කාව්‍යය වන කව්සිළුමිණෙහි කතුවරයා වන්නේ,
1.විද්‍යාචක්‍රවර්තීන් ය. 2. ධර්මසේන හිමියන් ය.
3. දෙවන පැරකුම්බා රජුය. 4. ශ්‍රී රාහුල හිමියන්ය.

33. ධම්ම පදයෙහි බුද්ධ දේශනාවන්ට ගැටපද හා විවරණ සැපයීම සඳහා කරන ලද කෘතියකි.
1. සියබස්ලකර. 2. සිඛ වළඳ හා සිඛවළඳ විනිස.
3. සද්ධර්මරත්නාකරය. 4. ධම්පියා අටුවා ගැටපදය.

34. තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් රචිත ග්‍රන්ථ වලට අයත් නොවන්නේ,
1. ශාසනාවතාරය යි. 2. පංචිකා ප්‍රදීපය යි. 3. පරෙවි සංදේශය යි. 4. බුද්ධිප්පසාදිනිය යි.

35. ප්‍රතිමා කරණයේ දී මඳක් උස් වූ ආසනයක හිඳගෙන කලවා දෙපසට විහිදුවා පාද පහළින් ඇති පද්මයක් වැනි පීඨයක් මත තබාගෙන සිටීමේ ආසන ක්‍රමය හඳුන්වන්නේ,
1. වීරාසනය ලෙසිනි. 2. භද්‍රාසනය ලෙසිනි. 3. පද්මාසයන ලෙසිනි. 4. වජ්‍රාසනය ලෙසිනි.


36. මහනුවර යුගයේ චිත්‍ර කලාව විදහා දක්වන ස්ථානයකි,
1. ගෝතමී විහාරය. 2. මාළිගාකන්ද විහාරය. 3. රණස්ගල්ල විහාරය. 4. රිදී විහාරය.

37. පොළොන්නරු යුගයේ විශාලතම චිත්‍රාවලිය දක්නට ලැබෙන්නේ
1. දිඹුලාගල ලෙන්වල යි. 2. මහියංගණයයේ ය. 3. තිවංක පිළිමගෙහිය. 4. සීගිරියේ ය.

38. දනට විද්වතුන්ගේ සම්භාවනාවට ලක් වූ කලාත්මක මුරගල හමුවන්නේ,
1. රත්නප්‍රසාදය නමැති ගොඩනැගිල්ලෙනි. 2. කුරුණෑගල නිල්ලක්ගමය.
3. අනුරපුර බිසෝ මාලිගය අසලිනි. 4. මිහින්තලේ කණ්ඨක චෛත්‍යය සමීපයෙනි.

39. ගරු කළ යුත්තන්ට ගරු නොකරන පිදිය යුත්තන් නොපුදන, අධික මානයෙන් යුත් තැනැත්තා
1. අල්පභෝගීව උපදී. 2. ප්‍රඥාව අඩුව උපදී.
3. අල්පේශාක්‍යව උපදී. 4. පහත් කුලවල උපදී.

40. පහත රූප සටහනේ දැක්වෙන්නේ බුදු පිළිම වල දැකිය හැකි මුද්‍රා කිහිපයකි. ඒවා පිළිවෙලින් දැක්වෙන පිළිතුර වනුයේ,




1. විතර්ක මුද්‍රාව, ධර්මචක්‍ර මුද්‍රාව, අභය මුද්‍රාව, භූමි ස්පර්ශ මුද්‍රාව.
2. ධර්මචක්‍ර මුද්‍රාව, විතර්ක මුද්‍රාව, භූමි ස්පර්ශ මුද්‍රාව, අභය මුද්‍රාව.
3. අභය මුද්‍රාව, භූමි ස්පර්ශ මුද්‍රාව, විතර්ක මුද්‍රාව, ධර්මචක්‍ර මුද්‍රාව.
4. භූමි ස්පර්ශ මුද්‍රාව, විතර්ක මුද්‍රාව, ධර්මචක්‍ර මුද්‍රාව, අභය මුද්‍රාව.

(1x40 = 40)

## II - කොටස

- **පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද 02-06 වන ප්‍රශ්නය දක්වා (i) කොටසකට ලකුණු 2 ක් ද (ii) කොටසට ලකුණු 3 ක් ද (iii) කොටසට ලකුණු 5 ක් ද වේ. 7 වන ප්‍රශ්නයට එක් කොටසකට ලකුණු 5 බැගින් ලකුණු 10 ක් හිමිවේ.**

(01) කෙටි පිළිතුරු සපයන්න.
 i. අනේපිඬු සිටුතුමා හා විශාඛා සිටු දේවිය විසින් බුදු රජාණන් වහන්සේට පූජා කළ ආරාම දෙක නම් කරන්න.
 ii. බුදුරජාණන් වහන්සේ පුරිසදම්ම සාරථී ගුණය ප්‍රකට කරමින් දමනය කළ යක්ෂයන් දෙදෙනෙක් නම් කරන්න.
 iii. ලක්දිව ඇති ප්‍රතිමාසර වර්ග වලින් දෙකක් ලියන්න.
 iv. දස අකුසල කර්මවලින් කාය කම්මයට අයත් කරුණු දෙකක් නම් කරන්න.
 v. බුදු දහමේ ඉගැන්වෙන ප්‍රධාන භාවනා ක්‍රම දෙක නම් කරන්න.
 vi. ආහාරයෙහි ප්‍රමාණය දැන අනුභව කිරීම නිසා යහපත් ප්‍රතිඵල ලැබෙන බව භද්දාලි සූත්‍රයෙහි දැක්වේ. ඒවායින් දෙකක් ලියන්න.
 vii. ලක්දිව ඇති ආබද්ධ හා අනාබද්ධ හිටි පිළිම දෙකකට උදාහරණ දෙකක් ලියන්න.
 viii. සතර අගති නම් කරන්න.
 ix. කුරුණෑගල යුගයේ රචිත සාහිත්‍ය කෘති දෙකක් නම් කරන්න.
 x. අත්තූපනායික ධර්ම පර්යාය යනු කුමක්දැයි කෙටියෙන් දක්වන්න.

(02) i. බුද්ධ කාරක ධර්ම වලින් දෙකක් නම් කරන්න.
 ii. ඔබ ඉහත නම් කරන ලද ඒවායින් එකක් කෙටියෙන් හඳුන්වන්න.
 iii. බුද්ධ කාරක ධර්ම සමාජ ජීවිතයට වැදගත් වන ආකාරය උදාහරණ සහිතව විස්තර කරන්න.

(03) i. පුද්ගලයෙකුගේ පිරිසිදුකම හෝ අපිරිසිදුකම හෝ පවතින්නේ තමා තුළමය. මෙම අදහස ප්‍රකට වන ධම්ම පද ගාථාව ලියා දක්වන්න.
 ii. එම ගාථාවේ සම්පූර්ණ තේරුම ලියා දක්වන්න.
 iii. ධම්මපද ගාථාවලින් පෙන්වා දෙන උපදේශ සිසුන් වශයෙන් ප්‍රායෝගික ජීවිතයට යොදාගෙන සාර්ථක පුද්ගලයෙකු වීමට මඟ පෙන්වයි. විමසන්න.

(04) සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන ආකාරයට
 i. "දාස කම්මකරා හෙට්ඨා - උද්ධං සමන බ්‍රාහ්මණා"
 යනුවෙන් දක්වෙන පාඨයෙහි සඳහන් සමාජ කණ්ඩායම් දෙක නම් කරන්න.
 ii. එහි දෙවනුව සඳහන් කළ සමාජ කණ්ඩායම විසින් අප වෙත සංග්‍රහ කළ යුතු ආකාරය දක්වන්න.
 iii. යුතුකම් ඉටු නොකිරීමෙන් පුද්ගල දියුණුව මෙන්ම සමාජ දියුණුවද බිඳ වැටෙන ආකාරය නිදසුන් මඟින් පැහැදිලි කරන්න.

(05) i. බහු ජාතික හා බහු ආගමික පරිසරයක සහජීවනයෙන් කටයුතු කිරීමට මඟ පෙන්වන බෞද්ධ ඉගැන්වීම් දෙකක් නම් කරන්න.
 ii. එයින් එක් ඉගැන්වීමක් කෙටියෙන් හඳුන්වන්න.
 iii. බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සහජීවනයෙන් ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව විමර්ශනයක් කරන්න.

(06) i. පළමු ධර්ම සංගායනාවට බලපෑ ආසන්නතම හේතුව ලියා දක්වන්න.
 ii. පළමු සංගායනාව පැවැත් වූ ස්ථානය, ඒ සඳහා දායකත්වය දැක්වූ රජතුමා, එයට මූලිකත්වය දැරූ රහතන් වහන්සේ නම් කරන්න.
 iii. ශාසනික චිර පැවැත්ම උදෙසා පළමු ධර්ම සංගායනාවෙන් සිදු වූ සේවය පැහැදිලි කරන්න.

(07) පහත සඳහන් මාතෘකා දෙකකට කෙටි සටහන් ලියන්න.
 i. ආර්‍යාෂ්ටාංගික මාර්ගය.  ii. පද්මාකාර ජීවිතය.  iii. දුටුගැමුණු රජතුමා.  iv. බෞද්ධ චිත්‍ර කලාව.

# තෙවන වාර පරීක්ෂණය - 2019

බුද්ධ ධර්මය

11 ශ්‍රේණිය

## පිළිතුරු පත්‍රය-11

## I කොටස

| | | | |
|---|---|---|---|
| 01 - 2 | 11 - 2 | 21 - 3 | 31 - 2 |
| 02 - 3 | 12 - 4 | 22 - 2 | 32 - 3 |
| 03 - 1 | 13 - 2 | 23 - 4 | 33 - 4 |
| 04 - 2 | 14 - 3 | 24 - 1 | 34 - 1 |
| 05 - 4 | 15 - 1 | 25 - 1 | 35 - 2 |
| 06 - 2 | 16 - 3 | 26 - 2 | 36 - 4 |
| 07 - 1 | 17 - 3 | 27 - 3 | 37 - 3 |
| 08 - 3 | 18 - 2 | 28 - 1 | 38 - 1 |
| 09 - 1 | 19 - 4 | 29 - 4 | 39 - 4 |
| 10 - 3 | 20 - 4 | 30 - 3 | 40 - 3 |

## II කොටස

(01) i. අනේපිඬු සිටුතුමා - ජේතවනාරාමය
විශාඛා සිටුදේවිය - පුර්වාරාමය

ii. ආලවක, සුචිරෝම, ඛරරෝම

iii. ගන්ධකුටි, පාසාද, ගෙඩිගේ

iv. ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමමිථ්‍යාචාරය

v. සමථ භාවනාව, විදර්ශනා භාවනාව

vi. රෝගාබාධ අඩු බව, නිදුක් බව, සැහැල්ලු පැවැත්ම, කාය බලය, සුව පහසු පැවැත්ම

vii. ආබද්ධ - අවුකන          අනාබද්ධ - මාළිගාවිල

viii. ඡන්දය, ද්වේශය, භය, මෝහය

ix. පන්සිය පනස් ජාතක පොත් වහන්සේ, සිංහල බෝධිවංශය, ථූපවංශය

x. තමා උපමා කොට අනුන් ගැන සිතීම.

(02) i. දාන පාරමිතාව, සීල , නෙක්ඛම්ම, පඤ්ඤා, විර්ය, ක්ෂාන්ති, සත්‍ය, අධිෂ්ඨාන, මෛත්‍රී, උපේක්ෂා පාරමිතාව

ii. එක් පාරමිතාවක් පිළිබඳව කෙටි හැඳින්වීමක් අපේක්ෂා කෙරේ. (11 ශ්‍රේණිය පිටු අංක 18-29 දක්වා)

iii. සමාජගත ජීවිතයට එක් එක් බුද්ධ කාරක ධර්ම වැදගත් වන අයුරු උදාහරණ සහිතව පැහැදිලි කර තිබිය යුතුය.

| | |
|---|---|
| නෙක්ඛම්ම පාරමිතාව | - අසීමිත ආශාවලින් තොරවීම, අඩු බලාපොරොත්තු ඇති බව, අල්පේච්ඡතාව |
| ප්‍රඥා පාරමිතාව | - නුවණින් කටයුතු කිරීම. |
| වීර්ය පාරමිතාව | - අරමුණක් පෙරදැරිව ඒ අරමුණ සාර්ථක කරගන්නා තුරු නොපසුබට උත්සහයෙන් වීර්යයෙන් කටයුතු කිරීමේ වැදගත්කම. |
| ක්ෂාන්ති පාරමිතාව | - ඉවසීමෙන් කටයුතු කිරීමේ අගය |
| සත්‍ය පාරමිතාව | - සත්‍යගරුකව ක්‍රියා කිරීමේ අගය |
| අධිෂ්ඨාන පාරමිතාව | - අධිෂ්ඨානයත් පෙරදැරිව කටයුතු කිරීම |
| මෛත්‍රී පාරමිතාව | - මෛත්‍රී සහගත සිතුවිලි වලින් යුක්තවීමෙන් ඇතිවන සතුට |
| උපේක්ෂා පාරමිතාව | - අන්තගාමී බවින් ක්‍රියා නොකිරීමේ අගය ලිවිය යුතුය. |
| දාන පාරමිතාව | - පරිත්‍යාගශීලී වීමේ අගය |
| සීල පාරමිතාව | - සිල්වත් විමේ අගය |

(03) i. අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති
අත්තනා අකතං පාපං - අත්තනාව විසුජ්ඣති
සුද්ධි අසුද්ධි පච්චත්තං - නාඤ්ඤො මඤ්ඤං විසෝධයේ

ii. යමෙකු පව් කළොත් එයින් ඔහු ම කෙලෙසෙන්නේය.
යමෙකු පව් නොකළොත් එයින් ඔහුම පිරිසිදු වන්නේය.

පිරිසිදුකම හා අපිරිසිදුකම පවතින්නේ තමා කෙරෙහිමය
එක් අයෙකුට තවත් අයෙකු පිරිසිදු කළ නොහැකිය.

iii. ධම්ම පදයෙන් ලබාදෙන උපදේශ සිසුන් වශයෙන් ප්‍රායෝගික ජීවිතයට යොදාගෙන සාර්ථක පුද්ගලයෙකු වීමට මඟ පෙන්වන අයුරු අනුමිත ගාථා 03 ක් වත් උපයෝගී කොට ගෙන පිළිතුර ගොඩනගා ඇත්නම් පිළිතුර දෙස බලා අදාළ ලකුණු පිරිනමන්න. (11 ශ්‍රේණිය පිටු අංක 49-53 දක්වා)

(04) i. යට දිසාව (හෙට්ඨිම දිසාව) - සේව්‍ය සේවක සබඳතාව
උඩ දිසාව - ගිහි පැවිදි සබඳතා

ii. ◆ පවින් වැළැක්වීම.
◆ යහපත් ක්‍රියාවල යෙදවීම.
◆ හොඳ හිතින්ම අනුකම්පා කිරීම.
◆ අසා නොමැති දෙය කියාදීම.
◆ අසා ඇති දෙය වඩාත් පැහැදිලි කරදීම.
◆ සුගතියට මඟ පෙන්වීම.
(සියලුම කරුණු සඳහන් කර ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න.)

iii. සිගාලෝවාද සූත්‍රයේ සඳහන් සමාජ කණ්ඩායම් උදාහරණ ලෙස ගෙන මෙම ප්‍රශ්නයට අදාළ පිළිතුර ගොඩනගා ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න.

(05) i. පංචශීලය, සතර සංග්‍රවස්තු, සිව්බඹ විහරණ, අත්තූපනායික ධර්ම පර්යාය

ii. ඉහත කරුණු වලින් එකක් පිළිබඳව කෙටි හැඳින්වීමක් අපේක්ෂා කෙරේ.

iii. ඉහත I හි සඳහන් කරුණු ඔස්සේ බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සහජීවනයෙන් ක්‍රියා කළ යුතු අයුරු පිළිබඳව ප්‍රමාණවත් විස්තරයක් තිබීම අවශ්‍ය වේ.

(06) i සුභද්‍ර භික්ෂුවගේ නුසුදුසු වචනය,

ii රජගහ නුවර වේභාර පර්වතය පාමුල සප්තපර්ණි ගුහා ද්වාරය අභියස , අජාසත්ත රජු , මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ.

iii. ⋆ විසිරී තිබූ ධර්ම විනය එක්රැස්කර සම්මුතියකට ගෙන ඒම,
⋆ ධර්ම විනය කොටස් කර භාණක පරපුරට පැවරීම.
⋆ නව විනය රීති නොපැනවීමටත් පැන වූ විනය නීති ආරක්ෂා කිරීමටත් ප්‍රතිඥා දීම. ආදී කරුණු බලා ලකුණු ලබා දෙන්න.

07) i ආර්ය අෂ්ටාංගික මාර්ගය :- ශ්‍රේෂ්ඨයෝ විසින් අනුගමනය කළ මග නිසා ආර්ය මාර්ගය නමින් හඳුන්වන බව දම්සක් පැවතුම් සූත්‍රයේ දී ආර්ය මග්ග යන වචනයක් මජ්ඣිමා පටිපදා යන්නෙන් එකට යෙදී ඇති බව.

⋆ ලෞකිකත්වයේ සිට ලෝකෝත්තර ගමන් කිරීමේ දී පුද්ගලයා තුළ තිබිය යුතු පිළිවෙළ පියවර බෞද්ධ ආර්ය මාර්ගය බව.

⋆ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි. ත්‍රි ශික්ෂා වලට බෙදු එක් එක් අංග පිළිබඳ වෙන්ව විස්තර කිරීම්ද තිබිය හැකිය. මේ කරුණු පිළිබඳ අවධානය යොමු කොට ලකුණු ප්‍රදානය කරන්න.

ii. පද්මාකාර ජීවිතය :-
● ද්‍රෝණ බමුණාට බුදුරජාණන් වහන්සේ තමන් කවුරුන්දැයි හඳුන්වා දුන් ආකාරය
● පද්මාකාර ජීවිතය යනු කුමක්දැයි ලිවීම.
● පද්මාකාර ජීවිතය බුදු සිරිතේ උදාහරණ මගින් දැක්වීම. ● පද්මාකාර ජීවිතයක ලක්ෂණ ලිවීම.
● පද්ම උපමාව අනුව බුදු රජාණන් වහන්සේ වදාළ ත්‍රිවිධ පුද්ගලයන් (10 ශ්‍රේණිය)

iii. දුටුගැමුණු රජතුමා :-
මෙතුමාගේ මූලික ජීවන තොරතුරු, ජාතික, ආගමික, ශාසනික, සාමාජික වශයෙන් සිදුකළ මෙහෙය ආදී තොරතුරු ඇතුළත් කොට පිළිතුර දෙස බලා අදාළ ලකුණු පිරිනමන්න.
(10 ශ්‍රේණිය 37-39 පිටු)

iv. බෞද්ධ චිත්‍ර කලාව :-
බුද්ධ ධර්මය, බුද්ධ චරිතය හා ශාසන ඉතිහාසය පිළිබඳව ජනතාවට කරුණු ඉගැන්වීමේ සන්නිවේදන මාධ්‍යයක් ලෙස බෞද්ධ චිත්‍ර කලාව සඳහන් කළ හැකිය. අනුරාධපුර යුගයේ සිට මේ දක්වා ඇති චිත්‍ර පිළිබඳ ඒ ඒ යුගවල විශේෂත්වයන් දක්වා ඇත්නම්ද ලකුණු පිරිනමන්න. (11 ශ්‍රේණිය 132-136 පිටු)